# නිර්මාණ Nirmana

## අසිරිමත් වෙසක් !

ලන්ඩනයේ අහස පුන්සඳ උදා කළ
මට සිහි කළේ මගෙ මව්බිම නබෝ තල
සම්බුදු සමිඳු මහ ගුණ කඳ ගලා හල
වේවා! සැමට බුදු මඟුලක් අමා බල

බෝපත් සැලෙන සෑ මලුවෙ විහාරෙක
සක්මන් සලෙක සිත නැවතුණ විලාසෙක
නුපුරුදු නුහුරු දේසෙක හුද කලාවෙක
සිහියට නැගේ බුදු ගුණ සුව අලාමක

සම්බුදු මැණී සුසිනිඳු නෙත් සිලිල කෙරෙන්
මල් සුවඳවත් විය මිලිනව නිවෙන යුරෙන්
මුළු ලොව සතපවා සනහන මිහිරි සරෙන්
අමතනු වැනිය බණ පද හදවතට හොරෙන්

පිපි මල් කැනක් වෙමි – පිනිදිය බිඳක් වෙමී
ගඳ දුම් ඉරක් වෙමි – හිමි පද තිරක් වෙමී
ලොව්තුරු සිතක් වෙමි – ජීවන පුදක් වෙමී
සමිඳුන් හමුව මම පින්බර කතක් වෙමී

♦ **කමලා හෙට්ටිආරච්චි**
**විදේශ අමාත්‍යංශය කොළඹ**

## Silent way

To go along the silent way
To step down from the life's sway
Not repent or weep away
As the deeds all done my way

Fulfilled the tasks the duties thrust
In bondage left to perform I must
Now it's the last hour left
To ponder what yet to be done

Oh! one thing remains unfulfilled
To bring myself to the Samadhi Bliss
In this relentless life sojourns
I may not crave to be born again!

♦ **Soma Waidyaratne**
**Washington - USA**

## වෙසක් උදාව

තුරු අතු පුරා සුවඳැති කුසුමන් පිබිදේ
මඳ සර ලෙසින් මෙත් ගුණ ගී නද විහිදේ
හමනා සිසිල් පවනැලි සුවයක් ගෙනදේ
සම්බුදු ගුණෙන් හදවත් සැනසෙයි නිබදේ


බුදු චරිතයේ තතු එකිනෙක සිහි කරමින්
සියුමැලි රූ රටා සුන්දර ලෙස මවමින්
තිලොවග පියාණන් රුව හද බැති වඩමින්
සිතුවම් කරති තොරණක් හැඩ මතු කරමින්

පහන් කූඩුවකි නිමවන්නේ දෙඅත
විසිතුරු පැහැය පිනවනවා දකින නෙත
මිදුලේ සල් උයනෙ අසිරිය මතුව ඇත
හැම සිත් තුළට බැති සිතුවිලි ගලා එත

නෙක බැතිමතුන් පන්සල වෙත ඇදෙනු පෙනේ
සන්සුන් බවක් ඒ මෙහොතේ සිතට දැනේ
දසතින් නැගෙන ගාථා නද මිහිර ගෙනේ
අපි සිහිකරමු සමිඳුන් මෙම වෙසඟ දිනේ

අවටින් මඳ අඳුර ගලනා නිසා වෙන
අහසේ වළාපෙළ අතරින් නැගී එන
වෙසඟේ පුර සඳෙන් සිසිලක් ලබා ගෙන
සුවපත් වේය සත්වග සිත් දයා වෙන

♦ ***දුලාංජලී සිරිවර්ධන***
***නීති පීඨය - කොළඹ විශ්ව විද්‍යාලය***



## සුදොවුන් සිතුවිලි

මැඩගෙන සියළු රජවරු සක්විති ඔටුණු
පළ දින දිනය ගැන තිබුණට පෙර ලකුණු
හරිමින ඒ සිරි අලුයම කෙළ පිඩ සෙ කුණු
දැනගෙන සිටිමි යන බව තපසට පුතණු

ගැවසෙන නොහැර නිති සෙවනැල්ලක් ලෙසට
නොසිතන කිසිදු අහිතක් බිම්බා දුවට
කියමින සිතැහි සමුගෙන රහසින් අපට
දැනගෙන සිටිමි පුත ඔබ යන බව වලට

සැරසෙන ලෙසට ගමනට රෑ ලැබුණු අණ
පිළිගෙන සදන ලද කන්ථක අසු පිටින
එළිවෙන කලින් නිහඬව චන්නත් රැගෙන
දැනගෙන සිටිමි යන බව කොටු පවුරු පැන

ලැබගෙන නුවණ නිවනට යන මහ පහදා
වැජඹෙන සසර ගොර බියකරු මරු පරදා
බුදුවන පිණිස රාහුල පුතු ඉපදුණු දා
දැනගෙන සිටිමි යන බව රජ ගෙය හැරදා

♦ ***වෛද්‍ය උපාලි අබේසිරි*** **Middlesex, UK**

## Vesak Prayer

Flowers are offered, lamps are lit
I look into your eyes divine.
Full of "**meth muditha, karuna**"
Humanitarian of all living beings.

How many Vesaks will pass good Lord
Till the world is touched by your holy feet ?
How many "**Araliyas**" will bloom good Lord
Till the fragrance of your compassion is felt ?

♦ **Randima Attygalle - *Sri Lanka***



## මහා කාරුණිකයාණෝ!

සසර සයුර තුළ
ඉම කොණ නොපෙනෙන
නැවියාණන් ඔබ එගොඩකරන සත
පිපුණු මලකි ඔබ ගිනියම් කතරේ
මෙත් කරුණාවේ සුවඳ විදාලන

හද බැති නොනිමෙයි දැල්වී දැල්වී
ඔබ කරුණා ගුණ මෙනෙහිකරන සඳ
ඇසිපිය ගැටෙනා මොහොත පමා නැත
ඔබ දුටු පමණින් නිසසල වන්නට

අසිරිමතුනි සම්මා සම්බුදු වූ
බඹ සුර නර හිස පාපිස්නක් කළ
උතුම් ලකුණු රැඳි සිරිමත් සිරිපා
වඳිම් බැතින් කුසුමින් නිති සරසා

මෙත් මුදිතා කරුණා ගුණ උතුරන
මහිමි දෙසූ සදහම් ආලෝකෙන්
බිඳක් ලබා දුදුක් නසා දිනක මතු
මම ද එතෙරවන සිහින දකින්නෙමි

♦ ***මාලපල්ලේ***
***කුමුදු රොහාන් අමරසිංහ***
Wood Green, **London**

## පිරිනිවන් පෑ බුදුවරු කොහි යෙත් ද?

" As a flame blown out by the wind
Goes to rest and cannot be defined
So the enlightened Man freed from selfishness
Goes to rest and cannot be defined
Gone beyond all images - Gone beyond power of words"

**සුළඟින් නිවා හළ පහන් සිල කොහි ගියාදැයි**
**නොදැනේ කියන්නට එසා සමතෙක් නොවන්නේ**
**එලෙසේ යමෙක් නැසුයෙ නම් මම යයි හැඟුම් සිත්**
**පැහැදුල් ඔවුන් ගිය අතක් කිසිවෙක් නොදන්නේ**
**නෙක් රූ තිබේ විස්වයෙහි එනමුත් ඔවුන් රූ**
**ඡායා ලෙසින් වත් ඇඳි කිසි තැන් නොවන්නේ**
**සියොතුන් දෙපා සළකුණක් අහසේ නොමැත් සේ**
**එතුමන් ගියේ කොයි දෙසැයි ලකුණක් නොවන්නේ**

♦ ***දයා ආනන්ද***

# වෙසක් කවි

## බුදු මිහිර !

නිශා කුමරියගෙ ගෙලේ
බැඳි මුතුපට වගෙ දිලේ
වෙසක් පහන් එළි රැලේ
කැල්මෙන් මුළු රට දිලේ

තෙල් මල් ගෙන හැම දෙනේ
පන්සල වෙත පිය මැනේ
මුමුනණ සදහම් ගුණේ
අදයි වෙසක් පෝ දිනේ

බුදු තෙමඟුල සිහි වෙලා
ගස් වැල් මල් බර වෙලා
සුල් සුගන්ධ පැතිරිලා
පුරසඳ ඇත බැබලිලා

සුදු පිරුවට ඇඳ ගෙනා
සිල් අරගෙන බෝ දෙනා
දාන සීල භාවනා
හම තැනකම දිස් වෙනා

බුදු හිමි ගැන හිත හිත
මලුවේ සුදු වැලි මත
තබා දෙ අත් නළ ලත
වඳින පිරිස් දස අත

මෙත් කරුණා විහි දෙනා
මුදිතා ගුණ ඉති රෙනා
බුදුරුව ළඟ වැඳ ගෙනා
සිතමු මෙලෙස හැම දෙනා

පිළිපැද බුදු බණ අගේ
බුදු රහතුන් ගිය මගේ
හොඳ බොදු බැතියෙකු වගේ
හිමි දුර යමු දිවි මගේ

♦ ***පද්මා කුරුප්පු***
**Paris France**

## ලුම්බිණි අසිරිය!

ලුම්බිණී සාල වනේ
වෙසක් පොහෝ දින
නිල් කහ සුදු රතු
ලස්සන මල් පිපුණේ
ලුම්බිණී සාල වනේ
මායා දේවිය
මල්බර වුනු සල්
ගස යට නතර වුනේ
ලුම්බිණී සාල වනේ
බිමට නැමුණු සල්
අත්තට අත දිදු
බිළිඳු කුමරු ලැබුණේ
ලුම්බිණී සාල වනේ
පියවර හතකට
පිපුණු නෙළුම් මල්
පොළවෙන් පහළවුනේ
ලුම්බිණී සාල වනේ
නෙළුම් මලක් මත
සිදුහත් කුමරා
සිංහ නාද කෙරුණේ
ලුම්බිණී සාල වනේ

අග්ගො හමස්මි ලොකස්ස !

**ප්‍රේමා එස්. රූපසිංහ**
**නුගේගොඩ Sri Lanka**

## තෙමඟුල දින

උදයක රන් හිරු කිරණේ
සහසක් නෙක මල් පිපුණේ
ලුම්බිණියේ සල් අරණේ
අප බෝසත් බිහිවූ දිනේ

පෙරුම් පිරූ අනුහසිනේ
ගිහි සැප හැර වන වැදුණේ
මරු පරදා බෝ සෙවනේ
බුදු පදවිය දිනුව දිනේ

සගමොක් සුව සලසමිනේ
සත වෙත සෙත පා මෙතිනේ
කුසිනාරා පුර උයනේ
පිරිනිවනට පත් එදිනේ

තෙමඟුල සිහිකර හිමිගේ
වදහළ ගුණ දහම් ගඟේ
පව් මල සෝදා සැමගේ
පින් ඵල සපුරමු වෙසඟේ

♦ **සේපාලිකා ජයසිංහ**
**Middx UK**

## තෙමඟුල් වෙසඟ

උපතද බුදුබව පරි නිරු වානේ
තෙමඟුල සිදුවුනෙ අද වැනි දානේ
බැති ගී ඇත හැම මුවගක් ගානේ
හිමි ඔබ හැර මට සරණක් නැනේ

ගුණබර හෙළයින් සිටියත් පොරණේ
බහුතර මිනිසුන් තව නැත හැදුනේ
සිහිකර දෙන්නට බුදුදුහිමිමි වරුණේ
අවසර මට දසබල හිමෑමි සඳුනේ

බිම්බා දේවිය රාහුල පුතු ටද
අං ගුලිමාලට හා දෙව්දතු ටද
පෙන් වූ සම මෙත සැමටම එක ලෙද
අං ගී රස සමිඳුන් නමදිමි අද

හිමි ගුණ පැතිරුණ මෙම මුළු දෙරණේ
තැනතැන බැඳි රැස් විහිදෙන තොරණේ
අපමණ ඉතිරෙයි බුදු ගුණ වරුණේ
ලැබ දන සැනසෙති ඔබ පිළි සරණේ

විලඳ කපුරු සහ පස් මල් ලාජා
සුවඳ මලින් මම කරනෙමි පූජා
සමිඳ දෙසුව සදහම් රස ඕජා
නමැද ගයමි ගුණ සම්බුදු රාජා

♦ ***ශාස්ත්‍රපති***
***මිගස්තැන්නේ රතනජෝති හිමි***
**සුනන්දාරාමය ගම්පහ Sri Lanka**

## වෙසක් පැතුම් !

සුදු සඳ කිරණ ලොව ආලෝකව ගලන
රන්වන් තාරකා දිගඹරයෙ හි දිලුන
සල් මල් පිපුන ඉමිහිරි සුවඳින් පිරුණ
බුදු සමිඳුන්ගෙ තෙමඟුල අද වෙසඟ දින

සැරසී සුදු වතින් පන්සල වෙත ඇදෙන
සුදුදු අරලියා වතුසුදු හද මල් පුදන
ගුම්නද සාදු සාදූ අහසට නැගෙන
දහසක් දනන් ඇත සගමොක් සුව පතන

කරුණා මෙත් සිසිල අවිහිංසාව වැදී
මදනල හමා වෙසඟේ තුම් සතුට දිදී
තෙල් මල් සුවඳ ගෙන මුදුනින් ඇදිලි බැඳී
තිලෙවට තිලක වන් හිමි සිරිපා නමදී

ඉපදෙන මැරෙන සත් වග දිගු සස රේදී
කුසලට නැමී ඉන් නෙක පව් මල සේදී
බුදු බණ අසා නිවනට යන මහ පෑදී
සැනසුම ලබත්වා! ලැබූ මෙම වෙස ඟේදී

යුද බිම සටන් වැගිරෙණ ලේ නොදකීවා
ක්‍රෝධය සිතින් වියැකී මෙත ඉතිරේවා
හරි දේ දකින පැණසර ඇස පෑදේවා
සදහම් එළිය ලැබ තුන්ලෝ බැබලේවා!

♦ ***කරුණා බස්නායක***
**Hampstead, London**

## සක්සඳ අමතයි !

කොහොමද නවක තොරතුරු අවුරුදු සරුද
අතිරස කොකිස් හෙම තව ඉතිරිව ඇතිද
නව සඳ බලන පිරිසක් අතරෙහි ඔබද
දුටුවෙමි ළඟට එන්නට බැරිවිය සබඳ

සිරිලක ඉපිද ලන්ඩන් වල සිටින සැම
එක්වෙනු පෙනිණ හැම බක්මහ උළෙල කම
නෙක හෙළ සිරිත් තුළ දැඩිවිය මිතුරු දම
සමගිය ඇතොත් රැකගත හැක සිහල කම

දවසින් දවස රට තොට උවදුරු වැඩෙතී
කට ඇති පුතුන් සදහට නිහඬම කරතී
උතුරේ ත්‍රස්තවාදෙට පිළිතුරු පවතී
බොරදිය තුළින් සමහරු මාලුත් සොයතී

බුදුහිමි වැඩිය හෙළ පිං කෙත බබලන්න
බණපද අසා මොහොතක් වුව සැනසෙන්න
ඇකයේ නිදන සා පැටවුන් සමගින්න
එන්නම් වෙසක් පෝයට මම සිල් ගන්න

බෝ මලුවකට ගොඩවී සිඹ වැලි පතර
සකසා පහන් වැට දැල්වෙන්නට නිතර
සැනසී අසා සමිඳුන් දෙසූ බණ චතුර
පින් කොට මෙලොව අපි කෙටිකර ගමු සසර

♦ ***මේජර් වී. බී. කරුණාරත්න***
**Oxford UK**

## සම්මා සම්බුදු හිමි සඳුනේ

තණ්හාවේ ගිනි සිළුව නිසල කළ
සංසාරේ දිගු ගමන නිමා කළ
මෙත් කරුණා මල් සුවඳක් වූ
සිත් අඳුරට හිරු එළියක් වූ
ලොව්තුරු සැප රජ මාළිග හමුවේ
පව් නිවනා නිවනේ මග දුටුවේ
කරුවල මනැසට බුදුරැස් විහිදූ
මරු පරදා නුවණේ නෙත පැහැදූ
සම්මා සම්බුදු හිමි සඳුනේ

***මෛත්‍රී පනාගොඩ*** **Sydney, Australia**